# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වෛද්‍ය (සංශෝධන)

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් 2024 ජූලි මස 02 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මැයි මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[269 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** **:** මෙම වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 39ආඅ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තකුගේ ම නම (1) වන උපවගන්තියේ (අඅ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ලේඛනයේ වෙනම කොටසක ඇතුළත් කිරීමෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හැකි වන පරිදි විධිවිධාන සැලැස්වීම ය.

***3 වන වගන්තිය*** **:**මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 39ආඅ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එමගින් විශේෂඥ වෛද්‍යවරයකු සඳහා තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

***4 වන වගන්තිය*** **:** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එමගින් 39ආඅ වගන්තිය යටතේ තාවකාලිකව ලියාපදිංචි වී ඇති විශේෂඥ වෛද්‍යවරුන් සඳහා ප්‍රකාශන ආකෘති පත්‍රයක් අලුතින් හඳුන්වා දෙනු ලබයි.

එල්.ඩී.-ඕ. 7/2024

## (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2024 අංක දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**105 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (5ඇ) වන උපවගන්තියේ "ඉවත් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඉවත් කරනු ලැබිය යුතු ය;'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (5ඇ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(5ඈ) 39ආඅ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා ස්වකීය හිමිකම සනාථ කරනු ලබන සෑම තැනැත්තකුගේ ම නම, රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තියේ (අආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලේඛනයේ වෙනම කොටසක ඇතුළත් කරනු ලැබිය යුතු අතර, ඉන්පසු 39ආ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබුයේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාගේ නම, විශේෂඥ වෛද්‍යවරුන් වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී ඇති තැනැත්තන්ගේ නම් ඇතුළත් ඉහත සඳහන් ලේඛනයේ එම කොටසින් ඉවත් කරනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආඅ අලුත් වගන්තිය ඇතුළත් කිරීම**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 39ආඅ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:- '